# යහපත් මිතුරු ඇසුර




ප්‍රකාශනය

යුනෙලි අයන්සා රාජපක්ෂ

2 ශ්‍රේණිය - A

මහාමායා බාලිකා විදුහල - මහනුවර

**ග්‍රන්ථ නාමය**

යහපත් මිතුරු ඇසුර

**කතෘ**

යුනෙලි අයන්සා රාජපක්ෂ

**චිත්‍ර**

යුනෙලි අයන්සා රාජපක්ෂ

**සංස්කරණය**

ජෙනුලි දහම්තා රාජපක්ෂ

**මුද්‍රණය**

2023 දෙසැම්බර්

# පිදුම

මට සැමදාම දිරියක් වූ මගේ අම්මාට අප්පච්චීට සහෝදරියටත් මහාමායා බාලිකා විදුහලේ දෙක වසරේ වර්තමානයේ මාගේ පන්තිභාර ගුරු මෑණියන් වන මංජුලා ප්‍රියංලිකා සුමණසිංහ ගුරු මෑණියන්ටත් මට මෙම අවස්ථාව ලබා දුන් මහාමායා බාලිකා විදුහලේ ශෂිකලා සේනාධීර ගරු විදුහල්පතිතුමියටත් මගේ මේ පුංචි වෑයම උපහාරයක් වේවා !

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර


විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකමත් එක කාලෙක ගීතායි,මීනායි
කියලා ළමයින් දෙදෙනෙක් සිටියා.





ගීතා හරිම කම්මැළියි. හැමදාම දවස පුරා රූපවාහිනිය බලනවා.



දවල් වෙලා ඉර පායනකල් නිදියනවා.

පොතේ පතේ වැඩ මගහරිනවා. ඒ නිසාම ගුරුවරුන්ගෙන් බැනුම් අහනවා.



මීනා හරිම කඩිසරයි. කරුණාවන්තයි. පාසලේ වැඩ ඉතා හොඳින් කරනවා. ඒ විතරක් නෙවෙයි අම්මාට, අප්පච්චිට උදව් කරනවා.



උදෙන් ම නැගිටිනවා. බුදුන් වඳිනවා. පාසලේ හැම වැඩක්ම සතුටින් කරනවා. සමිතිවල සින්දු කියනවා, නැටුම් නටනවා.

එක දවසක් පාසලේ තරගයක් තිබුණා. මීනා හැම තරගයකින්ම පළවෙනි තැන ලබා ගත්තා.



සහතික, තෑගි ගොඩක් ලැබුණා. ඒ නිසා මීනාට ලොකු සතුටක් සිතට දැනුණා. එයාගේ පවුලේ අයත් සතුටු වුණා.

ගීතාට කිසිම තරගයකින් තැනක් නොලැබුණු නිසා හරිම දුකින් අඬ අඬා සිටියා.





මීනා, ගීතා ළඟට ගියා.
" අඬන්න එපා. මම ඔයාට තරග දිනන
හැටි කියලා දෙන්නම්" කියා මීනා, ගීතාට
ආදරයෙන් කිව්වා.



එදා ඉදන් ගීතා,මීනා වගේ කම්මැලි නොවී
වැඩ කරන්න පටන්ගත්තා. ගුරුවරුන්ට,
අම්මාට, අප්පච්චිට කීකරු වී වැඩ කළා.



ඉතින් ඊට පස්සේ , පාසලේ තරගවලදී
ගීතාටත්, මීනාටත් දෙදෙනාටම තැනක්
ලැබුණා.

ටික කාලයක් යනකොට ඒ දෙන්නා
හොඳම යහළුවන් බවට පත්වුණා.



එයාලා දෙන්නාම ලොකු වෙලා හොඳින්
ඉගෙන ගෙන ජීවිතය ජය ගත්තා.

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

